# ලංසු සඳහා ආරාධනාවයි (IFB)

# කැස්බෑව නගර සභාව

සභාපති, කැස්බෑව නගර සභාව විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත පහත දැක්වෙන PHE ව්‍යාපෘති සඳහා සුදුසුකම්ලත් යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ගෙන් ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ප්‍රසම්පාදන ක්‍රමවේදය ඔස්සේ ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | ප්‍රසම්පාදන අංකය | වැඩ විස්තරය | අරමුදල් ප්‍රභවය | ඇස්තමේන්තු ගත පිරිවැය (රු. මි.) | කොන්ත්‍රාත් කාලය | CIDA ශ්‍රී. ප. සීමාව | ලංසු ඇපකරයේ වටිනාකම (රු.) | ආපසු නොගෙවන ලංසු ලිපි ලේඛන ගාස්තුව (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | KUC/4/6/2025/ASS/PUB.TOILET | පිළියන්දල පොදු වැසිකිළිය නවීකරණය කිරීම | සභා අරමුදල් | 7,795,745.54 (අනිශ්චිත සහ මූලික වියදම් සහිත VAT රහිත) | දින 60 | C8 හෝ ඉහළ | 77,000.00 | 3,500.00 +VAT |
| 02 | KUC/4/6/2025/ASS/JAYANTHI VIDYALA | ජයන්ති විද්‍යාල මාවත (තුන්වන පටුමග) පාර කොන්ක්‍රීට් කිරීම සහ අලුත්වැඩියා කිරීම | සභා අරමුදල් | 2,943,565.79 (VAT රහිත) | දින 60 | C9 හෝ ඉහළ | 30,000.00 | 3,500.00 +VAT |
| 03 | KUC/4/6/2025/ASS/Culvert | බෝකුන්දර පාසල් මාවත සහ යෝජිත නව පෙට්ටි බෝක්කුව | සභා අරමුදල් | 6,415,070.24 (VAT සහ අනිශ්චිත වියදම් හැර) | දින 60 | C8 හෝ ඉහළ | 73,000.00 | 3,500.00 +VAT |

1. ඉහත වැඩ වලට අදාළව සුදුසුකම් සපුරන ලද ලංසුකරුවන් විසින් වගුවේ සඳහන් පරිදි ආපසු නොගෙවනු ලබන ලංසු ලේඛන ගාස්තුව කැස්බෑව නගර සභාවේ සරප් වෙත මුදලින් ගෙවීමෙන් අනතුරුව **2025.10.17** දින සිට **2025.10.30** දක්වා සතියේ රාජකාරී දිනවල **පෙ.ව 9.00 සිට ප.ව 3.00** දක්වා අදාළ ලංසු ලේඛන කැස්බෑව නගර සභාවේ කර්මාන්ත අංශයෙන් ලබා ගත හැකිය. එම කාලසීමාව තුළ ලංසු ලියවිලි හා උපදෙස් පත්‍රිකා ගෙවීමකින් තොරව පරික්ෂා කළ හැකිය.
2. ශ්‍රී ලංකා මහා බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් "සභාපති, කැස්බෑව නගර සභාව" නමින් ලබාගත් කොන්දේසි විරහිත ඉල්ලූවිට ගෙවන ලංසු ඇපකරයක් හෝ කැස්බෑව නගර සභාව වෙත මුදලින් ගෙවන ලද කුවිතාන්සිපත් හෝ එක් එක් ප්‍රසම්පාදන වෙනුවෙන් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.ලංසු ඇපකරය, ලංසු විවෘත කළ දින සිට දින 49ක් වලංගු විය යුතුය.
3. ලංසුකරුවන් 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචිවී, ලියාපදිංචි වූ බවට මුදල් ගෙවන ලද කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.(කෙසේ වෙතත් කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර එම ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.)
4. විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි එක් එක් වැඩ ව්‍යාපෘති සඳහා වෙන වෙනම සකස් කර,මුල් පිටපත හා අනු පිටපත වෙන වෙනම කවර වල බහා මුද්‍රා තබා ඒවා නැවත එක කවරයක බහා මුද්‍රා තබා එහි ඉහළ වම් කෙළවර වැඩ විස්තරය හා ප්‍රසම්පාදන අංකය සඳහන් කර **2025.10.31 ප.ව 3.00** ට පෙර ලැබෙන සේ **"සභාපති, කැස්බෑව නගර සභාව, පිළියන්දල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කැස්බෑව නගර සභාවේ,ලේකම් තිල කාමරයේ තබා ඇති ලංසු බහාලන ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ හැක.
5. ලංසුපත් භාර ගෙන අවසන් වූ වහාම,ලේකම් තිල කාමරයේදී ලංසු විවෘත කිරීම සිදු කෙරේ. නියමිත වේලාවට පසුව ලැබෙන කිසිදු ලංසු පත්‍රිකාවක් භාර නොගන්නා අතර, ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලය පැවරූ නියෝජිතයෙකුට ඊට සහභාගි විය හැක.
6. සියලූ ලංසුකරුවන් ප්‍රසම්පාදන ලියවිලිවල සඳහන් නීති රීති වලට බැඳෙන අතර,ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

**සභාපති, ප්‍රසම්පාදන කමිටු සභාපති,**
**කැස්බෑව නගර සභාව.**
**දුරකථන අංකය - 0112614250/ 0112618100**
**ඊ-මේල් - uckesbewa@gmail.com**

**දිනය - 2025.10.16**